සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා

චක්‍රලේඛ ලිපි අංක 16 /2020

මගේ අංකය PPSC/ES/14/FI/02/31
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
කාර්යාලය
සබරගමුව පළාත
පළාත් සභා කාර්යාල සංකීර්ණය
නවනගරය,රත්නපුර
2020.08.24

ලේකම්
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ - තාක්ෂණ III ශ්‍රේණිය සඳහා (සීමිත බඳවා ගැනීම) අයදුම්පත් කැඳවීම -2020**

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.11.11 දින අනුමත කර ඇති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා වන බඳවා ගැනීම් පටිපාටියට අනුව ප්‍රධාන ලේකම්ගේ අංක DCSPT/07/P2/09/CM/DEP/02 හා 2020.08.18 දිනැති ලිපිය මගින් දන්වා ඇති සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව සහකාර අධ්‍යක්ෂ-තාක්ෂණ තනතුරේ පුරප්පාඩු 01 සඳහා පහත සුදුසුකම්ලත්, සබරගමුව පළාත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ දැනට සක්‍රිය සේවයේ සිටින නිලධාරීන්ගෙන් මින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1.0 අයදුම්කිරීම සඳහා තිබිය යුතු අධ්‍යාපන , වෘත්තීය සුදුසුකම්**

1. පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී තනතුරේ නිලධාරියකු වීම

හෝ

2. පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණයේ (ක්‍රීඩා පුහුණුකරු) I ශ්‍රේණියේ නිලධාරියකු වීම.

හෝ

3. පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණයේ (ක්‍රීඩා පුහුණුකරු ) II ශ්‍රේණියේ නිලධාරියකු වීම සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම.

**2.0 සපුරාලිය යුතු වෙනත් සුදුසුකම්**

01.තනතුර ස්ථිර කර තිබීම.

02. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම සහ අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

3.අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

4. අයදුම්පත් කැඳවීමේ නිවේදනය පළකරන දිනට සපුරා තිබිය යුතු බවට සඳහන් සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිම

3.0 සීමිත බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| අනු අංකය | ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1.ජ්‍යෙෂ්ඨතාවය | සබරගමුව පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි තනතුරට පත් වූ දින සිට එක් වසරකට ලකුණු 05 බැගින් | 30 | 30 | 40% |
| 2.අතිරේක වෘත්තීය සුදුසුකම් | රජයේ හෝ රජය පිළිගත් ආයතනයක ක්‍රීඩා කළමනාකරණය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව හදාරා සමත්ව තිබීම.<br>ක්‍රීඩා හෝ පරිපාලනය ආශ්‍රිත විෂයයන් පිළිබඳ හදාරන ලද පාඨමාලා දේශීය/විදේශීය<br>i. ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳව හෝ පරිපාලනය පිළිබඳ උපාධිය - 25<br>ii. මාස 3 කට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් සඳහා 15<br>iii. මාස 01 කට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් සඳහා 10<br>iv. සති දෙකකට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් සඳහා 05<br>v. සති එකට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් සඳහා 02 | 25 | 25 | |
| 3.ක්‍රීඩා පුහුණුකරු/දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි තනතුරේ සිටිය දී සිදුකරන ලද විශේෂිත කාර්ය කටයුතු | • ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ/පළාත් ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්ගේ/දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය මත අවසන් කරන ලද ව්‍යාපෘති සඳහා (එකකට ලකුණු 04 බැගින්)<br>(අදාළ විශේෂිත කාර්යය හෝ ව්‍යාපෘති කළ බවට සනාථ කිරීම සඳහා ලිපි ලේඛන හා වාර්තා ඉදිරිපත් කළ යුතු ය) | 20 | 20 | |
| 4.අමතර සුදුසුකම් | • පුහුණුකරුවකු,පරිපාලකයෙකු හෝ සංවිධායකයෙකු වශයෙන් නිලතල දැරීම.<br>ජාත්‍යන්තර මට්ටමින් නිලතල දැරීම - ලකුණු 10<br>ජාතික මට්ටමින් නිලතල දැරීම- ලකුණු 05<br>(සහතික පත්‍ර මගින් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු ය)<br>• 230 බී දරණ පොදු ආකෘතියෙන් ලබා ඇති ප්‍රශංසා සහතික සඳහා(එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම 10 ) | 10<br>10 | 20 | |
| 5.සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | සන්නිවේදනය හා පෞරුෂය | 05 | 05 | |
| මුළු ලකුණු | | 100 | 100 | |

## 4.0 අයදුම්කළ යුතු අන්දම

මෙහි පසුපිටේ සඳහන් ආදර්ශ අයදුම්පත් ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කරගත් අයදුම්පත්‍රයක් සබරගමුව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශ ලේකම්ට ඉදිරිපත් කළ යුතු ය. ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් තමන්ට ඉදිරිපත් වූ වහාම එකම ආවරණ ලිපියක් යටතේ මෙම කොමිෂන් සභාව වෙත 2020.09.03 දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතු ය. (එම අයදුම්පත්හි තොරතුරු පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කර බලා අයදුම්පත් ආකෘතියේ අදාළ කරුණු සහතික කරමින් මෙම කාර්යාලයට එවිය යුතු ය.) නියමිත සුදුසුකම් සපුරා ඇතැයි පෙනී යන අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීම සඳහා වූ විභාග ප්‍රවේශපත්‍ර අයදුම්පත්‍රයේ සඳහන් කාර්යාලීය ලිපිනයට යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

පී.එස්.ආර්.එම් විජයරාජ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

පිටපත්
01.ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව - කාරුණික දැනගැනීම සඳහා